




සිසිර දිසානායක

අතුරු මිතුරු - පන්ති මිතුරු

"මේ කාර් එකේ සයිඩ් මිරර්ස් එජස් කරලා තියෙන්නේ ටයර්වල හුළං බලන්නද?" පැන්සල පින්සලගේ වාහනේ රියදුරු ආසනේ වාහනේ රියදුරු ආසනේ වාඩිවෙලා පැති කණ්නාඩි දෙක තමුන්ට ඕන ගානට හදාගත්තා.

"ඕවා මං හදාගෙන තියෙන්නෙ මට ඕන ගානට...." පින්සල ඉස්සරහින් වාඩි වුණා.

"අනේ මන්ද, ඇස් වපරද කොහෙද කණ්නාඩි දෙක දෙවිදියක්!" පැන් හිනාවුණා.

"එහෙම අයත් ලෝකෙ ඉන්නවානේ. ආබාධිතකම්වලට හිනාවෙන එක හොඳද ? පින් ඇහුවේ තරහින්. පෑන් කට පියාන එන්පිම පණගැන්නුවා. පන්හිඳ දුවගෙන ඇවිත් පස්සේ ආසනේ ඉඳගත්තා. මේ තුන්දෙනා එකතුවෙලා මෙල්බන් ගුවන් තොටට ගියේ හදිස්සියෙන් ලංකාවට යන්න.

පින්ලගේ ගෙදර වත්තේ පොල්ටික කඩාගන්න කෙනෙක් නැතිලු. පොල්ගස් යටින් යන්න බයේ බෑ කියලා පින්ට පණිවිඩයක් ලංකාවෙන් ආවා. පැන්ගේ ගෙදර සීලිම පාත්වෙලා වඩු බාස් කෙනෙක් අල්ලගන්න විදියක් ඇත්තෙම නෑ කියලා ලංකාවෙන් කන්කෙඳිරිය. පන් නම් ගියේ සාහිත්‍ය මාසෙ පොත් සල්පිලට. පොත්පත් ටික්ක ලාබෙට ගන්න.

කටුනායක ඉඳන් අවිස්සාවේල්ලේ ගෙදරට යන අතර මග තල්දුවෙදි පින් දැක්කා තමුන්ගේ ගමේ පන්ති මිත්‍රයෙක් බස් නැවතුම් පලක ඉන්නවා. පොල් කඩන්න ගන්න කොක්කේ අගට අමුණන පිහියක් මිනිහගේ අතේ......

"හෝව්, හෝව්.....! " වෑන් එක එළවපු රියදුරු තැනගේ පිටට පින් තට්ටු කළා.

"ඇයි මොකද?"
"අපේ පංතියේ උන්නු පියසිරියා ! "

"අර අනුන්ගෙ මල් හොරෙන් කපපු "මල් පියා"? ඒ පැන් වාහනේ බස් නැවතුම පහුකරලා නැවැත්තුවා.
"මචං මොකද ඔතන ? "

"හලෝ පින් උඹලා රට ඉදං ද ? මං මේ ළග වත්තක පොල් වගයක් කඩන්න ගියා."
"හොඳ වෙලාව ! හොඳ වෙලාවට උඹ හම්බවුනේ" කෝ ඔය පොල් කොක්ක දියන් බලන්න." පියසිරි පින් අතට කොක්ක දුන්නා.

"මචං පොල් කොක්ක ගන්නත් එක්ක අපේ දිහා හවස් වෙලා වරෙන්. පොල් ටිකකුත් තියෙනවා කඩා ගන්න. උඹට දෙන්න රට චොක්ලට් වගයකුත් ඇති. පින් දනි පනි ගාලා වෑන් එකට ගොඩවුණා. වෑන් එක ඉගිල්ලුනා. රට චොක්ලට් කිව්වම පියසිරිට වෙන මොනවත් ඕන නෑ. එදා හවසම පින් ගේ වත්තේ පොල් ටික කැඩුනා. පව් අහිංසකයා......!

අපේ පංතියේ උන්නු ධනසිරි දැන් හොඳ කොන්තරාත්කාර මහත්තයෙක් ලු පැන්ගේ සීලිමේ වැඩේ ගැන ධනේටවත් කිව්වොත් හොඳා. හැබයි මිනිහා ධනේ උපද්දන්නට තමයි වැඩ කරන්නේ. පන්, පෑන්ට උපදෙසක් දුන්නා.

"ධනේ, මචං අපි ආවා. අපේ ගෙදර සීලිමේ ලී පරාල ටිකක් තියෙනවා උඹට වැඩකට ගත්තෑකි. " පැන් දුරකථනයෙන් ධනසිරිට කතා කළා. ධනසිරි පහුවදාම ගෝලයෝ දෙන්නෙකුත් එක්ක පැන්ලගේ ගෙදර. " කෝ මචං ලී ? "

"ලී සීලිමේ. සීලිම පාත්වෙලා. ගලවලාම ගනිං!" පැන් ඇගට නොදැනී කිව්වේ "ඩියුටි ෆ්‍රී" කඩෙන් ගෙනිච්ච රහමෙර බෝතලයක් කඩන ගමන්. පැය දෙකක් ගියේ නෑ. සීලිම බිම.

"වේයෝ කෑවත් කමක් නෑ මචං. මට මේවෑං වැඩක් ගත්තෑකි." ධනසිරි කිව්වේ රහ මෙර වීදුරු දෙකක් පිරිසිදුවටම රහ විඳලා අතින් කට පිහින ගමන්. ගෝලයේ අඩුම කුඩුම, වේයො කාපු ලී, දිරාපු ලී එකතු කළා. "හෙට අනිද්දා මේ පැත්තේ ඇවිත් සීලිම ගහලත් දීපන්. හැබැයි ඔය ලී වලින්නං නෙවෙයි. මං බඩු අරං දෙන්නම්." පැන් කිව්වා.

"හොඳා, හොන්දා ........" ධනසිරිගේ ඇස් දෙක තාම රට කොටේ."

පන්හිඳට නම් හොඳ ආරංචියකුත් ගෙදර ගියාම ලැබිලා.

"අතුරු මිතුරු" සංගත තැටිය හොඳම ළමා ගී එකතුව වෙනුවෙන් රාජ්‍ය සංගීත සම්මාන උළෙලට නම් කෙරිලා.

ආරාධනා පත්‍රයකුත් ඇවිත්. ඒකටත් යන්න හිතාන පන් කොළඹ ගියේ තමුන් ආ කාරණාව ඉෂ්ඨ කරගන්න. ඒ හොඳ පොත් ටිකක් පොත් සල්පිලෙන් ලාබෙට ගන්න. බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා ගේට්ටුව ළගදී පන්ට මෙල්බන් ඉන්න පන්ති මිත්‍ර චිත්‍රලතාව මුණ ගැහුණා. "පින්ගෙ පරණ ලව් එක " පන්ට මතක් වුණා.
"උඹ කවද්ද බං ආවෙ ? " චිත්‍රලතා ඇහුවා.

"පෙරේදා"
"දැන් කවද්ද යන්නෙ ? "

චිත්‍රා නිකං අහන්නේ ලංකාවෙ ඉන්න හැමෝම අපි රට ඉදං ආවම අහන ප්‍රශ්ණ දෙකමනෙ.

"ඒකත් ඇත්ත". එහෙ තොරතුරක් අහන්නවත් ඉසපාසුවක් තියෙන්නෙ කියෙන් කී දෙනාට ද ?

"ඒක නෙවෙයි ආපහු යනකොට ගොඩක් බර ගෙනියනවද ? "
"ඇයි අහන්නේ ? දන්නවනේ මං ඉතිං ගෙනියන්නේ ඇඳුම් ආයිත්තංනේ ...." චිත්‍රා ලතාවකට කිව්වා.

"අපෝ එහෙනං බර වෙයි. ගෑනු උදවියට ඉතින් ඇඳුම් කිව්වොත් වෙන මොනවද ? මං ඇහුවේ මං මෙතනින් ගන්න පොතක් දෙකක් ඔයා අතේ පටවලා අරින්න."

"අනේ ගන්න. ඇඳුම් ඒ තරං බර නෑ. කොහෙද ඒකවත් දැන ගන්න ගෑනු ගන්න එපායෑ."

"එහෙනං ඒ වැඩෙත් හරි" පන් පන්සිය පනස් ජාතකය පොත් දෙකක් ම ගත්තා බර හරියන්නත් එක්ක. බණ්ඩාර ඇහැළියගොඩ මහත්තයා ලියපු අළුත්ම සින්දු ඇතුලත් "අඩහැරේ" සංගත තැටිය එළි දැක්කුවෙත් පොත් සල්පිලේ ම ශාලාවක. එතනදී පන්ට සෑහෙන දන්න කියන පිරිසක් මුණ ගැහුණා. ඊට පස්සෙ පන් ගියේ මහරගම යොවුන් රඟහලේ පැවැත්වුණ රාජ්‍ය සංගීත සම්මාන උළෙලට.

හොඳම ළමා ගීත එකතුව වෙනුවෙන් "අතුරු මිතුරු" සංගත තැටිය නම් කරලා තිබුණාට සම්මානය ලැබුණෙ සමිත ප්‍රකාශකයින්නේ "අකුරු මිහිර" කියන "ළමා ගීත" එකතුවට. පුංචි දරුවන්ට සිංහල අකුරු හෝඩිය කියවන්න පහසුවෙන්න මහාචාර්ය ජේ.බී. දිසානායක මහත්තයා ලියපු වාගාලාප පොතක්ලු "අකුරු මිහිර" කියන්නේ. ඒවාට තාල දාලා ළමයෙක් කියපු ගායනා එකතු කරලා කරපු සංගත තැටියක්ලු ඒක. පන් ඒක කොහොමද කියලා අරන් බලන්න කඩ ගානේ හෙව්වා. ඒත් ලැබුණෙ නම් නෑ. අවංකව හරි යමක් කළා කියලා හිතට දැණුනම ඒ වැඩේ තත්වය කොහොමද කියලා බලන්න හිතෙනවා. ලංකාවේ දේවල් එක්ක බලනකොට අපේ දේවල් තියෙන්නෙ කොතනද කියලා බලන්න හිතෙනවා. ඒ අතින් අපට සතුටු වෙන්න පුළුවන්. මොකද ලංකාවේ නිෂ්පාදන වුණ ළමා ගීත සංගත තැටි පහළොවක් අතරින් "අතුරු මිතුරු" සංගත තැටිය මුලට ආ එක වටිනවා. පන් තමුන්ට ම කියා ගත්තා.

"අනික එක එක්කෙනාගෙ පස්සෙ නොයා සාධාරණයේ ඉෂ්ඨ වෙනවාද කියන එකත් බලන්න පුළුවන්. අපි පිට රටක හිටියත් තවම මේ දේවල් කරමින් ක්ෂේත්‍රයේ ඉන්නා බව ක්ෂේත්‍රයේ අය දැනගන්න එකත් වැදගත්. නිර්දේශිත නම් එකින් එක තිරයේ දාලා නිවේදකයා ඒ ගැන කිව්ව නිසා කවුරුවත් දැනගත්තා යමක් කරලා තියෙන බව. ඒකත් ඇතිනේ. "

"අතුරු මිතුරු" මේ තාක් ඉදිරියට ආව එකේ ගෞරවය හිමිවෙන්න ඕන සින්දු කිව්ව ළමයින්ට, වැඩිහිටි ශිල්පීන් පස් දෙනාට,ඒ වගේම තනු, සංගීතය නිර්මාණය කරපු අයට, දරුවන්ගේ වැඩිහිටියන්ට, ගුරුවරුන්ට. අන්තිමට සංගත තැටිය නිෂ්පාදනය කරන්න මූල්‍යමය අනුග්‍රහය දක්වපු දෙරන ආහාරපාන ඕස්ට්‍රේලියාවට ගෙන්නන ඩෙන්සිල් ජයවීර සොහොයුරාට. " ඒ පන්ගේ ස්තුතිය.




සහන් රන්වල මහත්තයා ඇතුළු රන්වල ජන ගී කණ්ඩායම පන්ගේ සින්දුවක් වේදිකාවේ රඟ දැක්කුවෙ පන් මේ උත්සවයට එන බවක් නොදැන. පන්ගේ තවත් පන්ති මිත්‍රයෙක් උත්සවයෙදි මුණ ගැහුණා. උන්නැහේ එතන ටිකක් භාරධූර කටයුත්තක යෙදිලයි උන්නේ.

"හලෝ සුමනේ. උඹත් මේකට සම්බන්ධද? "

"උඹ කවද්ද ආවෙ ? අපි ඉතින් මේකේ මණ්ඩලේ අයනේ. උඹේ වැඩේට වුණ දේ මමත් බලාගෙන. මේවයෙ ඉතින් දන්නැද්ද ? ගණං ගන්න එපා....."

"පිස්සු ද මචං. නැට්ට පිටින් අලි මැරෙන්නෙ ? සම්මාන දෙන වගක් දැනිලවත් නෙවෙයි අපි මේ වැඩවලට බැස්සෙ. පන් ගමට යන්න පිටත් වුණා.

ආපසු මෙල්බන් එන ගමනේ දී පන්, පින්, පැන් පන්ති මිත්‍රයින් තුන්දෙනාට චිත්‍රලතා පන්ති මිතුරියත් එකතු වුණා.

"දැන් බලන්න, අපිත් එක්කම එක පන්තියේ උන්නු අය වෙනස් වෙලා තියෙන හැටි! අහස් යානාවේ කතාව වුනේ ඔය ගැන."

සමහරුන්ට පිටරට යමක් කිව්වොත් ඊට වැඩිය දෙයක් නෑ. තවත් අයට බොන්න දෙනවා කිව්වම ඔක්කොම අමතකයි. ඉගෙන ගත්ත අයත් ගුරුකුල, කල්ලි වලට බෙදිලා. ගුරුවරු ගෝලයින්ට, ගෝලයින් ගුරුවරුන්ට සළකා ගන්නවා ඇරෙන්න හරි දෙයක් ඒ අයගෙන්වත් කෙරෙන්නෙ නෑ. පොඩි නූල් සූත්තරයක් දැම්මේ නැත්තං මොකුත්ම කෙරෙන් නෑ. ඔහොම ගියාම රටට වෙන්නෙ මොකක් ද ? අපි පිට රට ඉඳන් දැගලුවාට වැඩක් තියෙයිද ? සල්ලි එව්වට දියුණු වෙයිද ? දියුණුව කියන්නෙ මේකද ?

"මට නම් ඔය වාගෙ ඔය හැමෝම පේන්නෙ ආබාධිතයෝ වාගේ. අපි ඒ අයට අනුකම්පා කරනවා ඇරෙන්න හිනා වෙන එකේනම් තේරුමක් නෑ."

"ඔව් ඉතින් මානසික ආබාධ තියෙන අයට හිනාවෙලා වැඩක් තියේයැ? එතකොට ඒ අය හිතන්නෙ අපටයි පිස්සු කියලා ...


# VCE විභාගය සඳහා සිංහල භාෂාව

**සිංහල විෂය හදාරා VCE ලකුණු තර (Scale-Up) කර ගන්න**

ලොවම අගය කරන

- සාරධර්ම
- සිරිත් - විරිත්
- සංස්කෘතිය
- ඉතිහාසය
- සාහිත්‍ය කලා

රස විඳිමින් මව්බස ඉගෙන ගන්න

අභිමානවත් භාෂාවක උරුමකරුවකු වන්න

මව්බස ඉගෙන ගනිමින් VCE ජය ලබන්න

**සෙනසුරාදා දිනවල පෙ.ව 9.00 - ප.ව 12.15 දක්වා පහත සඳහන් වික්ටෝරියානු භාෂා පාසල් මධ්‍යස්ථානයන්හි 1 වසර සිට VCE දක්වා සිංහල පංති පැවැත්වේ.**

1. Brentwood Secondary College - Glen Waverly
2. Carwatha College - Noble Park
3. Hampton Park Secondary College - Hampton Park
4. Roxburgh College - Roxburgh Park
5. Epping Secondary College - Epping
6. Suzanne Cory High School - Werribee

kadapatha.com.au

වැඩි විස්තර සඳහා වික්ටෝරියානු භාෂා පාසලේ වෙබ් අඩවියට පිවිසෙන්න.
www.vsl.vic.edu.au
නැතහොත් ඔබේ දරුවාගේ තොරතුරු ඇතුළත් කොට
enrolhelp@vsl.vic.edu.au ලිපිනයට විද්‍යුත් ලිපියක් එවන්න.